## 3.2 ත්‍රිකෝණයක පාදයක් දික් කිරීමෙන් සෑදෙන බාහිර කෝණය එහි අභ්‍යන්තර සම්මුඛ කෝණ යුගල සමග පවතින සම්බන්ධය සෙවීමට ගණිත උපකරණයක් සැකසීම හා භාවිතය

(අ) පෙර දැනුම


i. සරල කෝණයක අගය ................... $^0$ කි.

ii. සරල රේඛාවක් මත බද්ධ කොණ යුගලයෙහි ඓක්‍යය...................... ය.

iii. සමාන්තර රේඛා ආශ්‍රිත කෝණ අතර සම්බන්ධතා

iv. බාහිර කෝණය /අභ්‍යන්තර කොණය/අභ්‍යන්තර සම්මුඛ කෝණ යුගල නිවරදිව හඳුනා ගැනීම

(ආ) උපකරණය සහ එහි උපාංග




(ඇ) උපකරණ නිමවුමට කාර්යය පත්‍රිකාව

i. රූපය-2 හි දැක්වෙන උපකරණය නිර්මාණය කිරීමට රූපය-1 හි ඇති කොටස් තුන සකස් කර ගන්න.

ii. රූපය-2 හි BC විශාලම පාදය වන පරිදි ABC විෂම පාද ත්‍රිකෝණය ඇඳ ගෙන, BC පාදය D දක්වා දික්කර බාහිර කෝණය ලබා ගන්න.

iii. විවිධ වර්ණ කාඩ් බෝඩ්, X-Ray කොල,භාවිතා කර රූපය-1 හි කොටස් 3 ඇමුණුම් වාසිද ඇතිව සකස් කර ගන්න. එම කොටස් රූපය-1 හි පරිදි P හා Q හි දී අසව් කර ගන්න.

iv. $A\hat{C}D$ වාපය මදක් ලොකුවට ද X, Y,Z වාප කුඩාවට ද ලකුණු කරන්න.

v. $A\hat{C}D$ , $\hat{X}$ , $\hat{Y}$ වෙන වෙනම වර්ණ ගන්වන්න. ත්‍රිකෝණයේ උඩු පැත්ත සේම යටි පැත්ත ද X,Y,Z යොදන්න.

vi. C ශීර්ෂය Q හරහා භ්‍රමණය කිරීමෙන් A මතට ගෙන එන්න.
B ශීර්ෂය P හරහා භ්‍රමණය කිරීමෙන් A මතට ගෙන එන්න. ඒ අනුව ත්‍රිකෝණයක බාහිර කෝණ හා අභ්‍යන්තර සම්මුඛ කෝණ දෙක අතර සම්බන්ධය ලබා ගන්න.

(ඇ) අමතර

i. ත්‍රිකෝණයක වර්ග ඵලය සඳහා සූත්‍රය ගොඩ නැගීමට, මධ්‍ය ලක්ෂ්‍ය ප්‍රමේයයේ ඇති සම්බන්ධතාව විමසුමට ත්‍රිකෝණයක අභ්‍යන්තර කෝණ ඓක්‍යය විමසුමට යොදා ගත හැකි දැයි විමසීම.

ii. මෙම උපකරණය වෙනත් විෂයය ක්ෂේත්‍ර සඳහා ගැලපේ දැයි විමසමින් තොරතුරු ගොනු කරන්න.

iii. මෙම උපකරණය වෙනුවට ඔබේම සැලසුම් මත උපකරණ තැනීමට උත්සාහ කරන්න.

iv. ඉහත උපකරණ දෙකම, අභ්‍යන්තර කෝණ ඓක්‍යය විමසුමට අදාළ උපකරණය ලෙස ද භාවිතා කළ හැකිය.